WWW.OLEVELAPI.COM

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019

## 61 - භූගෝල විද්‍යාව I, II

## අවසාන ලකුණු ගණනය කිරීම

### I පත්‍රය

| | |
|---|---|
| ප්‍රශ්න අංක 01 - 40 (01 X 40) | ලකුණු 40 |

### II පත්‍රය

#### I කොටස

| | |
|---|---|
| 1. ප්‍රශ්නය | ලකුණු 20 |

#### II කොටස

| | | |
|---|---|---|
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04 කට ලකුණු 40 |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 8. ප්‍රශ්නය | ලකුණු 10 | |

WWW.OLEVELAPI.COM

| | |
|---|---|
| I පත්‍රය | ලකුණු 40 |
| II පත්‍රය | ලකුණු 60 |
| අවසාන | ලකුණු 100 |

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ලකුණු සටහන් කිරීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................
..................................................
.................................................. √ $\frac{4}{5}$ (△)

(ii) ..................................................
..................................................
.................................................. √ $\frac{3}{5}$ (△)

(iii) ..................................................
..................................................
.................................................. √ $\frac{3}{5}$ (△)

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

WWW.OLEVELAPI.COM

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

WWW.OLEVELAPI.COM

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

## 1 වන ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

1. භූගෝල විද්‍යාව 10 හා 11 ශ්‍රේණිවල විෂය නිර්දේශවල සියළුම ඒකක වල විෂය කරුණු ආවරණය වන පරිදි දැනුම අවබෝධය භාවිතය හා විශ්ලේෂණ හැකියාවන් පිලිබද විමසීම.
2. ප්‍රස්තාරික ක්‍රම මගින් ඉදිරිපත් කෙරෙන භූගෝල විද්‍යාත්මක දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමේ හැකියාව පිරික්සිම
3. සිතියම් හා රූප සටහන් ඇසුරින් භූගෝල විද්‍යාත්මක තොරතුරුවල අවකාශීය ව්‍යාප්තිය පිළිබද දැනුම හා අවබෝධය පිරික්සීම
4. නිශ්චිත කරුණු පිළිබඳ දැනුම විමසීම
5. විවිධ ස්ථානවල පිහිටීම පිළිබද දැනුම විමසීම

6 .භූගෝල විද්‍යාත්මක තොරතුරුවල හේතු-ඵල සම්බන්ධතාවය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම

WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

2019.12.12 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ..............................

## භූගෝල විද්‍යාව I

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** ශිලා ගෝලයේ කොටසක් වන කබොල පෘථිවි ස්කන්ධයෙන් .....1%......... ක් පමණ වේ.
(1% / 5% / 10%)

**2.** මුළුමනින් ම දක්ෂිණාර්ධගෝලයෙහි පිහිටා ඇති මහාද්වීපය ...ඕස්ට්‍රේලියාව......... වේ.
(දකුණු ඇමරිකාව / අප්‍රිකාව / ඕස්ට්‍රේලියාව)

**3.** ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳව මුල්ම අදහසක් ඉදිරිපත් කරන ලද්දේ ...ඇරිස්ටෝටල්...... විසිනි.
(ටොලමි / ඇරිස්ටෝටල් / ඉරටොස්තිනීස්)

**4.** 'නොරින් 10' නමින් හැඳින්වෙනුයේ වැඩි එලදාවක් සහිත ...තිරිඟු........ වර්ගයකි.
(වී / තිරිඟු / කපු)

**5.** ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උද්‍යානයක් ......ගන්නෝරුව............ පිහිටුවා ඇත.
(ගන්නෝරුව / අගුනකොලපැලැස්ස / මාතලේ)

● අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **නි** යන්න වටා ද, වැරදි නම් **වැ** යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** සාගර පත්ලේ හටගන්නා නොයෙකුත් කම්පන හේතු කොට ගෙන වෙරළ දෙසට ගමන් ගන්නා විශාල සාගර තරංග සමූහය සුනාමි රළ ලෙස හැඳින්වේ. (නි) වැ

**7.** ශ්‍රී ලංකාවේ වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගන්නේ ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය මගිනි. නි (වැ)

**8.** නිෂ්පාදන ක්‍රියාවලියෙහි දී විවිධ රසායනික ද්‍රව්‍ය මිශ්‍ර කිරීම වර්තමානයේ ශ්‍රී ලංකාවේ නිපදවන තේවල ගුණාත්මකබව වැඩි කිරීමට හේතු වී ඇත. නි (වැ)

**9.** භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැය කරන මුදලට වඩා වැඩි මුදලක් කර්මාන්තයට අදාළ පර්යේෂණ සඳහා වැය කිරීම විද්‍යුත් කර්මාන්තයේ විශේෂ ලක්ෂණයකි. (නි) වැ

**10.** ආනවිලුන්දාව අභය භූමිය, බුන්දල ජාතික වනෝද්‍යානය හා මාදු ගඟ අන්තර් ජාතික වැදගත්කමකින් යුතු තෙත් බිම් ලෙස ප්‍රකාශිත ස්ථාන තුනකි. (නි) වැ

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- අංක **11** සිට **18** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** ආසියා මහාද්වීපයේ රටවල් අතුරෙන් වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන්නේ චීනය හා ...ඉන්දියාව... යන රටවල් දෙකෙහි ය.


**12.** ශ්‍රී ලංකාවේ ගංගා අතුරෙන් විශාලතම පෝෂක ප්‍රදේශයක් අයත් වන්නේ ....මහවැලි........ ගංගාවට ය.

**13.** පෘථිවි අභ්‍යන්තරයේ ඇති මැග්මා සිසිල් වී ඝන වීමෙන් ........ආග්නේය....... පාෂාණ නිර්මාණය වේ.

**14.** වර්ෂණයෙන් ලැබෙන ජලය පොළොව තුළට කාන්දු වී අභ්‍යන්තරයේ අපාරගම්‍ය පාංශු ස්තර මත තැන්පත් වීමෙන් ......භූගත............ ජලය නිර්මාණය වේ.

**15.** ආයු අපේක්ෂාව, සාක්ෂරතාව හා ක්‍රය ශක්තිය මත ගැළපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ..මානුෂ සංවර්ධන.. ..................... දර්ශකය ගණනය කිරීමේ නිර්ණායක ලෙස යොදා ගැනේ.

- අංක **16** සිට **18** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගි කර ගන්න.




*මූලය : ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන - 2019, ශ්‍රී ලංකා මහ බැංකුව*

ඉහත ප්‍රස්තාරයට අනුව,

**16.** වැඩිම තේ නිෂ්පාදනයක් සිදු වී ඇත්තේ ...2013.... වර්ෂයේදී ය.

**17.** නිෂ්පාදනයේ දැඩි විචල්‍යතාවක් දක්නට ඇත්තේ ...පොල්........ වගා අංශයෙහි ය.

**18.** සාපේක්ෂ වශයෙන් තේ හා රබර් අංශයෙහි අඩු නිෂ්පාදනයක් පෙන්නුම් කර ඇත්තේ .2016... වර්ෂයේදී ය.

- අංක **19** සිට **22** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**19.**

| 'අ' බල ශක්තිය | 'ආ' බලාගාරය පිහිටි ස්ථානය |
|---|---|
| 1. සුළං | A - ඉඟිනියාගල |
| 2. ජල විදුලිය | B - කෙරවලපිටිය |
| 3. තාප විදුලිය | C - පුත්තලම |
| | D - බරුතකන්ද |

(1) A, B, C (2) C, A, B (3) C, B, A (4) D, B, C (..2..)

20. 'අ' වනාන්තර වර්ගය

1. නිවර්තන තෙත්
2. කඳුකර වියළි
3. කඩොලාන

'ආ' වෘක්ෂලතාවල ස්වභාවය

A - කිරල, දියකඳුරු, ගිංපොල් වැනි ශාක
B - පතොක්, එරමිණියා වැනි කටු සහිත ශාක
C - වියන් ස්තර ගණනාවකි. හොර, කීන, මිදෙල්ල වැනි ශාක
D - තෘණ වර්ග, මහරත්මල්, අරළු, නෙල්ලි, කහට වැනි ශාක

(1) A, B, D (2) B, D, A (3) C, A, B (4) C, D, A (..4..)

21. 'අ' යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන

1. ෂන් ෂුවාං
2. නගෝයා
3. බර්මිංහැම්

'ආ' රට

A - ඇමරිකා එක්සත් ජනපදය
B - චීනය
C - එක්සත් රාජධානිය
D - ජපානය

(1) A, B, C (2) B, C, A (3) B, D, C (4) C, B, A (..3..)

22. 'අ' නගරය

1. ෂැංහයි
2. කරච්චි
3. කයිරෝ


'ආ' ආශ්‍රිත ගංගාව

A - නයිල්
B - සින්ධු
C - හොවැංහෝ
D - යැංට්සිකියෑං

(1) A, B, C (2) C, B, A (3) D, A, B (4) D, B, A (..4..)

● අංක **23** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන රූපසටහන යොදා ගන්න.

වැවක් හා වාරි ඇළවල් දැක්වෙන මෙම රූපසටහනට අනුව,




23. වැව් ජලය යොදාගෙන වගා කටයුතු කෙරෙන ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?
(1) A (2) B
(3) C (4) D (..2..)

24. වැව් රක්ෂිතය පිහිටි ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..4..)

25. වැව ආශ්‍රිතව ජනාවාස පිහිටුවීමට වඩාත් උචිත ප්‍රදේශ දැක්වෙන අක්ෂර දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A හා C (2) A හා D (3) B හා D (4) C හා D (..1..)

● අංක **26** සිට **36** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා, ඊට හිමි **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත ලියා දක්වන්න.**

26. ශ්‍රී ලංකාවේ අක්ෂාංශගත පිහිටීම නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) උ. අ. 5° 55' සිට 9° 51' (2) උ. අ. 6° 55' සිට 9° 50'
(3) උ. අ. 5° 55' සිට 8° 51' (4) උ. අ. 6° 00' සිට 10° 00' (..1..)

27. ශ්‍රී ලංකාවට වාසුළිවල බලපෑම බහුලව සිදු වන්නේ,
(1) මාර්තු සිට මැයි දක්වා ය. (2) අගෝස්තු සිට ඔක්තෝම්බර් දක්වා ය.
(3) ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා ය. (4) දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ය. (..3..)

28.
- වසර පුරාම උෂ්ණත්වය 18 °C ට වැඩි ය.
- ශීත සෘතුවක් නොමැත.
- වසර පුරා පැතිරුණු අධික වර්ෂාපතනයක් ඇත.

ඉහත ලක්ෂණ අයත් දේශගුණ වර්ගය වන්නේ,
(1) සෞම්‍ය දේශගුණයයි. (2) මධ්‍යධරණී දේශගුණයයි.
(3) තුන්ද්‍රා දේශගුණයයි. (4) නිවර්තන දේශගුණයයි. (..4..)

**29.** සම්පූර්ණයෙන් ම ගොඩබිමින් වට වූ මුහුදු යුගලය කුමක් ද?
(1) බෝල්ටික් මුහුද සහ රතු මුහුද (2) අරාබි මුහුද සහ අද්‍රියාතික් මුහුද
(3) කැස්පියන් මුහුද සහ ඒරල් මුහුද (4) කළු මුහුද සහ කහ මුහුද (..3..)

**30.** ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පිහිටි වී පර්යේෂණායතනය කුමක් ද?
(1) බෝඹුවෙල (2) බතලගොඩ (3) මහඉලුප්පල්ලම (4) අම්බලන්තොට (..1..)

**31.** ශ්‍රී ලංකාවේ කිවුල් දිය ධීවර කර්මාන්තය සඳහා ප්‍රමුඛත්වය ගන්නා ස්ථාන **තුනක්** ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) තංගල්ල, මිරිස්ස, ගාල්ල (2) පුත්තලම, හලාවත, මුන්දලම
(3) ත්‍රිකුණාමලය, යාපනය, කෝකිලායි (4) හලාවත, බෙන්තොට, බේරුවල (..2..)

**32.** ඉල්ලුමට සරිලන පරිදි මෑත කාලයේ ශ්‍රී ලංකාවේ වැඩිම වර්ධන වේගයක් පෙන්නුම් කර ඇති සත්ත්වපාලන අංශය වන්නේ,
(1) කිරි නිෂ්පාදන අංශයයි. (2) කුකුළු පාලන අංශයයි.
(3) එළු හා බැටළු පාලන අංශයයි. (4) ඌරු මස් නිෂ්පාදන අංශයයි. (..2..)

**33.** ශ්‍රී ලංකාවේ සංචාරක කලාප අතුරෙන් 'පුරාතන නගර' කලාපයට අයත් නගර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) අනුරාධපුර, දඹුල්ල, මහනුවර (2) සීගිරිය, දඹුල්ල, කතරගම
(3) මහනුවර, පොළොන්නරුව, යාපනය (4) ත්‍රිකුණාමලය, මහනුවර, කුරුණෑගල (..1..)

**34.**
A - ඓතිහාසික උරුම
B - නව නිර්මිත
C - කාරුණික බව
D - පාරිසරික උරුම
E - ආගන්තුක සත්කාර

ඉහත දක්වා ඇති සංචාරක ආකර්ෂණ අතුරෙන් 'අස්පෘශ්‍ය උරුම (Intangible heritages)' **දෙකක්** ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A හා B (2) B හා C (3) C හා E (4) D හා E (..3..)

**35.** දේශගුණික වෙනස්වීම් කෙරෙහි බලපාන හරිතාගාර වායු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) මීතේන්, ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන්, කාබන්ඩයොක්සයිඩ්
(2) නයිට්‍රජන් ඔක්සයිඩ්, මීතේන්, ඔක්සිජන්
(3) ජලවාෂ්ප, නයිට්‍රජන්, කාබන්ඩයොක්සයිඩ්
(4) ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන්, ආගන්, මීතේන් (..1..)

**36.** ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා ව්‍යාප්තිය අනුව අඩුම ජනසංඛ්‍යාවක් දක්නට ලැබෙන පළාත මින් කුමක් ද?
(1) නැගෙනහිර පළාත (2) උතුරුමැද පළාත (3) ඌව පළාත (4) උතුරු පළාත (..4..)

- පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **37** සිට **40** තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. ගෝලීය උෂ්ණත්වය
2. සාගර ජල මට්ටම

B - 1. උන්නතාංශය
2. වායුපීඩනය

C - 1. ජනසංඛ්‍යා වර්ධන වේගය
2. වියපත් ජනසංඛ්‍යාව

D - 1. පරිසර දූෂණය
2. අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීම

**37.** පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..2..)

**38.** පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ ද වැඩි වීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..1..)

**39.** දෙවැන්නේ අඩු වීම පළමුවැන්නේ ද අඩු වීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..4..)

**40.** පළමුවැන්න හා දෙවැන්න අතර ඍජු සම්බන්ධතාවක් නොදක්වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..3..)

* *

## 11 වන ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

1. 1:50 000 භූ ලක්ෂණ සිතියම්වල භාවිතා වන වර්ණ හා සංකේත පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම
2. 1:50 000 භූ ලක්ෂණ සිතියම්වල භෞතික හා සංස්කෘතික ලක්ෂණ විවරණය කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ හැකියාව පිරික්සීම
3. ශ්‍රී ලංකාව හා ලෝක සිතියම ඇසුරින් කාලීන වැදගත්කමක් උසුලන භූගෝල විද්‍යාත්මක තොරතුරුවල ව්‍යාප්තිය හා පිහිටීම පිළිබඳ දැනුම හා අවබෝධය විමසීම
4. පෘථිවි උප පද්ධතිවල ක්‍රියාකාරීත්වය, ඒවායේ අන්තර් සම්බන්ධතාවය හා භෞතික පරිසරය මිනිස් කටයුතු කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ දැනුම හ අවබෝධය පිරික්සීම
5. ශ්‍රී ලංකාවේ රබර් වගාවේ ව්‍යාප්තිය, වගාව සම්න්ධ ගැටලු හා ආර්ථික සංවර්ධනයට ලබා දෙන දායකත්වය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම
6. ශ්‍රී ලංකාවේ බලශක්ති භාවිතය ගැටළු හා බලශක්ති සංරක්ෂණය පිළිබද දැනුම හා ආකල්ප විමසීම
7. ලෝකය හා ශ්‍රී ලංකාවේ නැව් තැනීමේ කර්මාන්තයෙහි වර්ධනය හා නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම
8. ලෝක ජන ව්‍යාප්තිය කෙරෙහි භෞතික සාධකවල බලපෑම පිළිබඳ අවබෝධය හා ලෝකයේ හා ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය හා ජන සංඛ්‍යා ව්‍යුහය පිළිබඳ විශ්ලේෂණාත්මක හැකියාව පිරික්සීම
9. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම
10. ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික ආපදා පිළිබඳ අවබෝධය හා ආපදා කළමනාකරණය පිළිබඳ න්‍යායාත්මක දැනුම අවබෝධය හා භාවිතය විමසීම

WWW.OLEVELAPI.COM

## භූගෝල විද්‍යාව II

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.

අංක (i) සිට (iii) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ - Ⓑ රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය කුමක් ද?
(අවතල බෑවුම / උත්තල බෑවුම / මොහොර) (ලකුණු 01 යි)

(ii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(ලඳු කැලෑ / තණ බිම් / වනාන්තර) (ලකුණු 01 යි)

(iii) Ⓓ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(පටු දුම්රිය මාර්ගය / පුළුල් ඒකීය දුම්රිය මාර්ගය / පුළුල් ද්විත්ව දුම්රිය මාර්ගය) (ලකුණු 01 යි)

(iv) Ⓔ අක්ෂරයෙන් දක්වා කොටුකර ඇති ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති ප්‍රධාන ව්‍යාපාරික බෝගය කුමක් ද? (ලකුණු 01 යි)

(v) Ⓗ අක්ෂරයෙන් දක්වා කොටුකර ඇති ප්‍රදේශයෙහි දක්නට ලැබෙන පොදු සේවා සැපයෙන ආයතන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (vi) හා (vii) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් **නි** යන්න ද වැරදි නම් **වැ** යන්නද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(vi) සිතියම් කොටසෙහි දැක්වෙන ප්‍රදේශය ශ්‍රී ලංකාවේ පළාත් කීපයකට අයත් බවට සාධක ඇත. (ලකුණු 01 යි)

(vii) Ⓧ මංසන්ධියේ සිට Ⓨ මංසන්ධිය තෙක් විහිදෙන මහා මාර්ග කොටසෙහි දුර කි. මී. 4කි. (ලකුණු 01යි)

(viii) සිතියමට පහළින් Ⓟ, Ⓠ හා Ⓡ වශයෙන් දක්වා ඇඳ ඇති රේඛීය පරිමාණ අතුරෙන් නිවැරදිව ඇඳ ඇති පරිමාණ රේඛාවට හිමි අක්ෂරය පිළිතුරු පත්‍රයේ ඊට නියමිත ස්ථානයේ ලියා දක්වන්න. (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක **9**) යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) **නයිජර් ගංගාව** - Ⓐ, Ⓑ, Ⓒ

(ii) මෑතක දී ලැව් ගිනි නිසා විනාශ වීමේ තර්ජනයට මුහුණපා ඇති **ඇමේසන් වනාන්තරය** - Ⓓ, Ⓔ, Ⓕ

(iii) **හොං කොං** - Ⓖ, Ⓗ, Ⓙ

(iv) හිම කඳු දියවීමේ තර්ජනයට ලක්ව ඇති **ග්‍රීන්ලන්තය** - Ⓚ, Ⓛ, Ⓜ

(v) **ඩැමෝඩාර්** යකඩ හා වානේ කාර්මික ප්‍රදේශය - Ⓟ, Ⓠ, Ⓡ

(ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක **9**) යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) කසළ රඳවනය පිහිටා ඇති **අරුවක්කාලු** - Ⓐ, Ⓑ, Ⓒ

(ii) **බදුල්ල දිස්ත්‍රික්කය** - Ⓓ, Ⓔ, Ⓕ

(iii) **කන්කසන්තුරේ** ධීවර වරාය - Ⓖ, Ⓗ, Ⓙ

(iv) රළ මත ලිස්සා යාමේ ක්‍රීඩාවට ප්‍රසිද්ධ ස්ථානයක් වූ **ආරුගම්බේ** - Ⓚ, Ⓛ, Ⓜ

(v) සංචාරක ආකර්ෂණයක් වූ **මාදු ගඟ** - Ⓟ, Ⓠ, Ⓡ (ලකුණු 05 යි)

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


**61 II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

භූගෝල විද්‍යාව II / புவியியல் II / **Geography II**




SCALE : 1 : 50 000



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

විභාග අංකය / சுட்டெண் / Index Number ..................................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only

**1.** (අ) /(அ) /(a)

(i) අවතල බෑවුම

(ii) වනාන්තර

(iii) පුළුල් ඒකීය දුම්රිය මාර්ගය

(iv) රබර්

(v) තැපැල් කාර්යාලය / උපාවිය

රෝහල / පාසල

දුම්රිය නැවතුම්පල / නානායම
(බෝවයින් තුනක් හමු වීම)


(vi) නි

(vii) වැ

(viii) R

10

(ආ) /(ஆ) /(b)




(i) B

(ii) F


(iii) H

(iv) K

(v) P

/5

(ඉ) /(இ) /(c)




(i) B

(ii) F

(iii) H

(iv) M

(v) R

/5

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

## II කොටස

**2.** (i) පෘථිවි වායුගෝලයේ ස්තර අතුරෙන්

(a) සියලු කාලගුණික සංසිද්ධීන් හටගන්නා ස්තරයේ නම ද

(b) ඉතා අධික උෂ්ණත්වයක් ඇති ස්තරයේ නම ද අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 02 යි)

(ii) මිනිසාගේ ප්‍රයෝජනය සඳහා ඉතිරිව ඇති මිරිදිය ජලයේ ගුණාත්මකභාවය අඩු වීම කෙරෙහි බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) වනාන්තර විනාශ වීම ජෛවගෝලීය උප පද්ධතියෙහි පැවැත්ම කෙරෙහි බලපාන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

. (i) (A) පරිවර්තී ගෝලය

(B) තාප ගෝලය

**ලකුණු 02**

(ii)
- කර්මාන්ත සදහා යොදා ගන්නා ජලය අපවිත්‍ර ජලය ලෙස ජලාශවලට පිට කිරිම.
- කම්හල්වලින් අපද්‍රව්‍ය ලෙස පිට කෙරෙන විවිධ රසායනික හා කාබනික ද්‍රව්‍ය ජලයට මිශ්‍රවිම.
- කෘෂිකර්මානත්යේ දී පසට එක්වන පොහොර වර්ග, කෘෂි රසායන (වල් නාශක හා කෘමි නාශක) ජලයට මිශ්‍ර වීම.
- මලද්‍රව්‍ය අපවහනය නිසා මතුපිට ජලය හා භූගත ජලය අපවිත්‍රවීම.
- ජල මුලාශ්‍රවලට කැලි කසල බැහැර කිරීම.
- ගොඩබිමට අක්‍රමවත්ව කසල බැහැර කිරිම.

**හේතු තුනකට ලකුණු** 03)

(iii)
- සත්ව වාසභූමි විනාශ වීම.
- ජෛව පද්ධති විනාශ වීම/ජෛව විවිධත්වයට හානි සිදුවීම.
- මතුපිට පස සේදීයාම.
- පස නිසරුවීම.
- දේශගුණික වෙනස්වීම කෙරෙහි ඇති කරන බලපෑම් නිසා ජෛව ගෝලයේ සමතුලිත බව බිදවැටිම.

**කරුණු** 03 ට **ලකුණු** - 03

**විස්තරයට ලකුණු** 02


05

WWW.OLEVELAPI.COM

**3.** (i) යාබදව දක්වා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි රබර් වගාව සඳහා වැදගත්වන අංක ①න් සහ අංක ②න් දක්වා ඇති දිස්ත්‍රික්ක **දෙක** මොනවා දැයි අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තය වර්තමානයේ මුහුණ පා ඇති ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) රබර් අමුද්‍රව්‍යයක් ලෙස අපනයනය කිරීම වෙනුවට දේශීය කර්මාන්ත සඳහා යොදා ගැනීම හා නිමිභාණ්ඩ ලෙස අපනයනය කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හේතු වන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)




(i) (1) කළුතර
(II) රත්නපුර

**ලකුණු** 02

(ii)
- බිම් ඒකකයකින් ලැබෙන අස්වැන්න අඩු වීම
- රබර් ඉඩම් වෙනත් කටයුතු සඳහා යොදාගැනීම
- කිරි කපන්නන්ගේ හිඟය
- නියමිත මිලක් නොමැති වීම හා මිල උච්චාවචනය වීම
- ආදේශකවලින් එල්ලවන තරගය
- වෙනත් රටවලින් එල්ලවන තරගය
- ඉහළ නිෂ්පාදන වියදම්
- දේශගුණික/කාලගුණික බාධා

WWW.OLEVELAPI.COM

**ගැටළු තුනට ලකුණු** 03

(iii)
- රැකියා උත්පාදනය.
- මෙරටට අවශ්‍ය භාණ්ඩ නිපදවීම මගින් ඒවා ආනයනය කිරීමට යන මුදල් ඉතිරි වීම.
- නිමි භාණ්ඩ අපනයනයෙන් වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ඉපැයීමට හැකිවීම
- රැකියා නියුක්තිය නිසා ජනතාවගේ ජීවන තත්වය ඉහළ යාම.
- ප්‍රාදේශීය සංවර්ධනයට ඉවහල් වීම.

**කරුණු** 03 **ට ලකුණු** - 03
**විස්තරයට ලකුණු** 02
05

4. (i) ජලය හැරුණු විට විදුලිබල උත්පාදනය සඳහා ශ්‍රී ලංකාවේ බහුලව භාවිත කෙරෙන බලශක්ති ප්‍රභව **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බලශක්ති පරිහරණයේ දී මතුවන ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) බලශක්ති අරපිරිමැස්මෙන් භාවිත කිරීම මගින් අත්වන වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

. (i) (1) ඛනිජ තෙල්
(II) ගල් අඟුරු

**ලකුණු** 02

(ii)
- පිරිවැය අධිකවීම
- සුළං සූර්ය ශක්තිය වැනි ඇතැම් බලශක්ති සම්පත් පාරිසරික සාධක මත තීරණය වීම සහ ඒ සදහා අධික මූලික පිරිවැයක් යෙදවීමට සිදුවීම
- ඛනිජතෙල් ආනයනයට විශාල මුදලක් වැය වීම
- ස්වභාවික ආපදා මගින් හානි සිදුවීම
- පරිසර දුෂණය
- ඇතැම් බලශක්ති සම්පත් ක්ෂය වීමේ අවදානම
- බලශක්ති පරිහරණයේ දී නාස්තිය හා අපතේ යාම.

**ගැටලු තුනට ලකුණු** 03

(iii)
- විදේශ විනිමය ඉතිරිකර ගත හැකිවීම.
- වැඩිවන ඉල්ලුමට සැපයීම පහසුවිම.
- ඉතිරිවන මුදල් වෙනත් සංවර්ධන කටයුතුවලට යෙදවිය හැකිවීම.
- තිරසර පැවැත්මට දායකවිම.
- පරිසර හානි අවම වීම.
- ස්වභාවික උපද්‍රව හා දේශගුණ විපර්යාසවලින් එල්ලවන බලපෑම් අවම කරගැනීමට හැකිවීම.

WWW.OLEVELAPI.COM

**කරුණු** 03 ට **ලකුණු** - 03
**විස්තරයට ලකුණු** 02
05

**5.** අතීතයේ බොහෝ යුරෝපා රටවල දියුණුවට පත්ව තිබූ නැව් තැනීමේ කර්මාන්තය වර්තමානයේ ලෝකයේ ප්‍රමුඛ නිෂ්පාදන කර්මාන්තයක් බවට පත්ව ඇත.

(i) අතීතයේ යුරෝපා රටවල නැව් තැනීමේ කර්මාන්තය දියුණු වීමට බලපෑ හේතු **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 02 යි)

(ii) නැව් තැනීමේ කර්මාන්තය සම්බන්ධ නූතන ප්‍රවණතා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදන කර්මාන්තයෙහි මෑතකාලීනව වර්ධනයක් දක්නට ඇත. ඊට හේතු **දෙකක්** පැහැදිලි කරන්න.

(b) ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධ
(I) අමුද්‍රව්‍ය ආශ්‍රිත ගැටලුවක් ද
(II) වෙළෙඳපොළ ආශ්‍රිත ගැටලුවක් ද
කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(i)
- පුනරුදයෙන් පසුව හටගත් දේශගවේෂණ, වෙළෙද, ධීවර හා යුද කටයුතු සදහා නැව්වලට ඇති වූ ඉල්ලුම.
- නිෂ්පාදනයට අවශ්‍ය දැව හා වානේ පහසුවෙන් ලබාගත හැකිවීම.
- නැව් තටාක සැදීමට අවශ්‍ය කඩතොලු සහිත වෙරළ ප්‍රදේශ තිබීම.
- රාජ්‍ය අනුග්‍රහය.
- මුදල් අයෝජනය කල හැකි ධනවතුන් එරට සිටීම.

**ලකුණු 02**

(ii)
- ප්‍රවාහනය කරන භාණ්ඩ හෝ සේවාව අනුව සුවිශේෂ යාත්‍රා නිපදවීම.
- ප්‍රමාණයෙන් අති විශාල අධි සුඛෝපභෝගී මගී නැව් නිපදවිම.
- විවිධ කාර්යයන් සදහා සුවිශේෂ වූ නැව් නිපදවීම.
  උදා :- (යුද/සාගර ගවේෂණ/ධීවර/පුස්තකාල/රෝහල්)
- යාන්ත්‍රික ශ්‍රමය බහුලව භාවිතය. (රොබෝ තාක්ෂණය)
- නැව් නිෂ්පාදනයට යොදා ගන්නා බලශක්ති සම්පත් වෙනස්වීම. (න්‍යෂ්ටික බලය වැනි)
- පාරම්පරික රටවල් වෙනුවට නව කාර්මික රටවල් නැව් කර්මාන්තයේ පුමුඛ විම.
- දියුණු තාක්ෂණ භාවිතය. :- (G.P.S. වැනි)

**ප්‍රවණතා තුනට ලකුණු 03**

WWW.OLEVELAPI.COM

(iii) (a)
- ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ සිදු වූ වර්ධනය.
- ධීවර කටයුතු පුළුල් වීම.
- පාරම්පරික අත්දැකීම් නිසා උසස් වර්ගයේ බෝට්ටු නිපදවීමේ හැකියාව.
- ශ්‍රී ලංකාවේ බෝට්ටු සදහා විදේශ ඉල්ලුම වර්ධනය වීම.

**හේතු දෙකට ලකුණු 02**

(b) (I) **අමුද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු**

- දිගුකාලීන භාවිතය නිසා ක්ෂයවෙමින් පැවතීම
- ස්වභාවික අමුද්‍රව්‍ය වෙනුවට කෘත්‍රිම අමුද්‍රව්‍ය යොදා ගැනීම
  (උදා :- කෘත්‍රිම රබර්/කෘත්‍රිම කෙඳි)
- ආනයනය කළ අමුද්‍රව්‍ය මත කර්මාන්ත රඳා පැවතීම සිදුවීම

(II) **වෙළෙඳ පොළ ආශ්‍රිත ගැටලු**

- අතීතයේ බටහිර යුරෝපා රටවලට උරුමව පැවති වෙළෙඳපොල නැගෙනහිර ආසියා කලාපයට මාරුවීම නිසා යුරෝපා රටවල ආර්ථික අර්බුද හටගැනීම
- තරඟකාරී වෙළෙඳපොළ සඳහා දැරීමට සිදුවන ප්‍රචාරක වියදම් භාණ්ඩ මත පැටවීම නිසා භාණ්ඩ මිල ඉහළ යාම
- විවිධ භාණ්ඩ ආදේශක වෙළෙඳපොලට පැමිණීම
- බහුජාතික සමාගම් සමග තරග කිරීමට සංවර්ධනය වෙමින් පවතින රටවලට දුෂ්කරවීම
- තීරුබදු ප්‍රතිපත්තිවල බලපෑම

**කරුණු දෙකට ලකුණු** 02
**විස්තරයට ලකුණු** 01
03
**(a) ලකුණු** 02
**(b) ලකුණු** 03
05

**6.** (i) (a) කටුක දේශගුණික සාධකවල බලපෑම නිසා අප්‍රිකාවේ හීන ජනව්‍යාප්තියක් ඇති ප්‍රදේශයක් ද

(b) රළු භූ විෂමතාව බලපෑම නිසා ආසියා මහාද්වීපයේ හීන ජනව්‍යාප්තියක් ඇති ප්‍රදේශයක් ද පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (a) සංවර්ධනය වෙමින් පවතින රටවල ජනසංඛ්‍යා වර්ධනය වේගවත්ව සිදු වීම නිසා එම රටවල් මුහුණපාන ගැටලු **දෙකක්** ද

(b) සංවර්ධිත රටවල බෙහෙවින් අඩු ජනසංඛ්‍යා වර්ධනය නිසා එම රටවල් මුහුණපාන ගැටලු **එකක්** ද සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා ව්‍යුහය ආශ්‍රිත ව පැනනැගී ඇති ගැටලු **තුනක්** දක්වා ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(i) (a) සහරා කාන්තාරය/කොංගෝ වනාන්තරය/කලහාරි කාන්තාරය.

(b) හිමාලය කඳුකරය.

WWW.OLEVELAPI.COM

**ලකුණු** 02

(ii) (a)
- වැඩිවන ජන සංඛ්‍යාවට සමානුපාතිකව සම්පත් වැඩි නොවීම.
- යැපෙන්නන්ගේ සංඛ්‍යාව වැඩිවීම නිසා ජාතික ආදායමෙන් විශාල කොටසක් ඔවුන් නඩත්තු කිරීමට වැයවීම .
- පොදු පහසුකම් සැපයීමේ ගැටලුව.
- රැකියා වියුක්තිය ඉහළ යාම.
- වෙනත් සමාජ ආර්ථික ගැටලු. (උදා - ආහාර, නිවාස හිගය වැනි)
- සංවර්ධනයට බාධා ඇතිවීම.

(b)
- ජන හායනයක් සිදුවීම.
- සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ දී ශ්‍රම හිගයකට මුහුණ පෑමට සිදුවීම.
- වියපත් ජන සංඛ්‍යාව ඉහළ යාම.

**(a) ලකුණු** 02
**(b) ලකුණු** 01
**ලකුණු** 03

(iii) • වියපත් ජන සංඛ්‍යාව වැඩිවීම හා සම්බන්ධ ගැටලු.
• බාලවයස් ජන සංඛ්‍යාව අඩු වීම හා වියපත් සංඛ්‍යාව වැඩි වීම නිසා ශ්‍රම බලකායේ අඩු වීමක් හට ගැනීම.
• ජන සංඛ්‍යාවේ පුම්තිරි අනුපාතය වෙනස් විම, ස්ත්‍රීන් සංඛ්‍යාව වැඩි විම, ශ්‍රම බලකායට ඇතිවන බලපෑම, යැපෙන්නන් වැඩි විම, ප්‍රජනන වයසේ ස්ත්‍රීන් වැඩි වීම නිසා ජන සංඛ්‍යාව ඉහළ යාම.

**ගැටලු 03 ට ලකුණු - 03**
**එකක් විස්තර කිරීමට ලකුණු 02**
**05**

7. (i) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන මූලික අරමුණ කුමක් දැයි සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(iii) ශ්‍රී ලංකාවේ මහා මාර්ග හා දුම්රිය මාර්ග සංවර්ධනය සඳහා මෑත දී ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** නම් කර ඒවා රටේ සංවර්ධනයට හේතු වී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(i) විවිධ ප්‍රදේශවල ඇති සම්පත් හා භෞතික පරිසරය ප්‍රයෝජනයට ගනිමින් විෂමතාව අවමවන පරිදි මානුෂ සුබසාධනය සඳහා කටයුතු කිරීම අරමුණ වේ. (මෙවැනි අදහසක් ඉදිරිපත් කර තිබීම)

**ලකුණු 02**

(ii) ජන සවිය, සමෘද්ධි, දිවි නැගුම, මගනැගුම, එක ගමකට එක වැඩක්, නිවාස සංවර්ධන ව්‍යාපෘති, ග්‍රාමීය විදුලි ව්‍යාපෘති, පූජා මූලික ව්‍යාපෘති, ගැමි දිරිය, ගම්පෙරළිය, කිරි ගොවි ගම්මාන වෙනත් ප්‍රාදේශීය ව්‍යාපෘති

**ව්‍යාපෘති තුනක් නම් කිරීම ලකුණු 03**

WWW.OLEVELAPI.COM

(iii) • අධිවේගී මාර්ග - කොළඹ - මාතර / කොළඹ - කටුනායක / පෑලියගොඩ සිට අතුරුගිරිය දක්වා ගුවන් පාලම් මාර්ගය
• කොළඹ - මහනුවර අධිවේගී මාර්ගය
• පවතින මහාමාර්ග පුළුල් කිරීම හා කාපට් කිරීම
• ගුවන් පාලම්
• මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය
• භූගත උමං මාර්ග
• මාතර - කතරගම යෝජිත අධිවේගී මාර්ගය
• දක්ෂිණ දුම්රිය මාර්ගය දියුණු කිරීම
• උතුරු දුම්රිය මාර්ගය අලුතින් ඉදිකිරීම
• මාතර - බෙලිඅත්ත නව දුම්රිය මාර්ගය
• ත්‍රිත්ව දුම්රිය මාර්ග ඉදිකිරීම (උදා :- කොළඹ සිට රාගම දක්වා)

- **රටේ සංවර්ධනයට දායකවන ආකාරය**

- කාලය ඉතිරිවීම
- ඉක්මනින් භාණ්ඩ ප්‍රවාහනය
- භාණ්ඩ ප්‍රවාහනයට යන වියදම අඩු වීම
- සුරක්ෂිත ප්‍රවාහනයක් සැලසීම
- ඉන්ධන භාවිතය අවම කරගත හැකිවීම

**සංවර්ධන ක්‍රියාමාර්ග 03 ට ලකුණු** - 03
**සංවර්ධනයට හේතුවන ආකාරය පැහැදිලි කිරීමට ලකුණු** 02
05

**8.** (i) මිනිස් ක්‍රියාකාරකම්වල බලපෑමෙන් තොරව හටගන්නා ස්වාභාවික උපද්‍රව **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02 යි)


(ii) පහත Ⓐ, Ⓑ හා Ⓒ වලින් දක්වා ඇති දිස්ත්‍රික්කවලට ප්‍රබලව බලපාන ස්වාභාවික උපද්‍රවය කුමක් දැයි අනුපිළිවෙළින් නම් කරන්න.

Ⓐ - කළුතර හා රත්නපුර
Ⓑ - අනුරාධපුර හා මන්නාරම
Ⓒ - කෑගල්ල හා නුවරඑළිය
(ලකුණු 03 යි)

(iii) (a) යාබද ව ඇති ආපදා කළමනාකරණ චක්‍රය රූපසටහනෙහි Ⓐ හා Ⓒ අවස්ථා **දෙක** මොනවා දැයි පිළිවෙළින් නම් කරන්න.

(b) රූපසටහනෙහි දැක්වෙන Ⓑ අවස්ථාවේ දී ක්‍රියා කළ යුතු ආකාරය ක්‍රියාමාර්ග **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)




(i) සුනාමි, සුළි සුළං, භූමි කම්පා, අකුණු සැර, ජල ගැලීම්, ගංවතුර, නියඟ, ගිනිකඳු පිපිරීම්, අයිස්කඳු කඩා වැටීම්, ලැව් ගිනි, නායයාම්

**දෙකක් නම් කිරීම සඳහා ලකුණු** 02

(ii) A - ගංවතුර/ජලගැලීම්, B - නියඟය - C - නයායෑම්

**තුනක් නම්කිරීමට ලකුණු** 03

(iii) (a) පෙර සූදානම
(c) යථා තත්වයට පත් කිරීම

**ලකුණු** 02

(b)
- ආපදාවට ගොදුරු වූ ප්‍රජාවගේ ආරක්ෂාව සහතික කිරීම
- වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම
- භෞතික දේපල හැකි පමණ ආරක්ෂා කිරීම
- තාවකාලික නිවාස ලබාදීම
- ආහාරපාන ලබාදීම
- ඇඳුම් පැළඳුම් ලබා දීම
- උපදේශන සේවා සැපයීම

ක්‍රියාමාර්ග 02 ලකුණු - 02
පැහැදිලි කිරීමට ලකුණු 01
03

**(a)** ලකුණු 02
**(b)** ලකුණු 03
05

WWW.OLEVELAPI.COM